
# සෞන්දර්යයේ චමත්කාරය විඳින්නට මුතුරාජවෙල තෙත් බිම

යූ.පී.එස් පතිරණ

**කොන්ක්‍රීට් වනාන්තර වලින් හා ගෙන්දගම් පොළොවෙන් කර්කශ භාවයට පත් ඒකාකාරී පරිසරයෙන් හෙම්බත්වූ නාගරික මිනිසාට එම අසහනකාරී පරිසරයෙන් මඳකට හෝ පලායාමට දරණ උත්සාහයේදී අගනුවරට ඉතාම ආසන්නයේම පිහිටි නෙත් සිත් බැඳ තබන විවේකී පරිසරයක වරුවක් පමණ හෝ කාලයක් රැඳී සිට සොබා සෞන්දර්යයේ චමත්කාරය විඳ දරා ගැනීමට අවස්ථාවක් ලැබුණහොත් එය කොතරම් සැනසිල්ලක් විය හැකිද? එවන් නෙත් පිනවන සිත් සනසන අපූරු තෙත් බිමක් කොළඹ සිට කි.20 ක් පමණ නැතහොත් මිගමුවේ සිට කි.මී.15 ක පමණ දුරින් පිහිටා ඇති බව සමහර විට ඔබ නොදන්නවා විය හකිය.**

මෙම තෙත්බිම නම් මුතුරාජවෙල වගුරු බිමයි. කොළඹ - මිගමුව පාරේ තුඩැල්ල හන්දිය දක්වා ගොස් එතැනින් හැරී පමුණුගම පාරේ කිලෝමීටරයක පමණ දුර ගෙවා පැරණි ලන්දේසි ඇල පසුකර මීටර් 400 ක් පමණ ගිය විට මෙම මුතුරාජවෙල තෙත් බිමට ප්‍රවේශ විය හැකිය.

හෙක්ටයාර් 7000 ක පමණ භූමි ප්‍රමාණයක් වසා පැතිරුණු මුතුරාජවෙල වගුරුබිම හා මිගමුව කළපුව කොළඹට ඉතා ආසන්නයේ පිහිටි. ඉතා වටිනා සම්පතකි. වර්තමානයේ මෙම තෙත් බිමෙත් හෙක්ටයාර් 2000 ක පමණ භූමි ප්‍රමාණයක් සංරක්ෂණය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත්තේ එහි පවත්නා ඉතා පොහොසත් ශාක හා සත්ව සම්පත නිසාත්, වැදගත් ස්වභාවික ගංවතුර රැඳවුම් කලාපයක් නිසාත් ය.




අටවන වීර පරාක්‍රමබාහු රජ දවස (ක්‍රි.ව.1484 - 1508) කොළොම්තොටට උතුරේ බටහිර වෙරළ තීරයෙහි තිබුණු සරුසාර කෙත්යායක් වශයෙන් නැතහොත් මුතුවන් සහල් ලබාදුන් කෙත්යායක් ලෙස සඳහන් වි ඇති මුතුරාජවෙල ආශ්‍රිත සරිසර පද්ධතිය ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයෙන් ඉතා ඉහල මට්ටමක පවතින පරිසර පද්ධතියක් ලෙසද වාර්තා වි තිබේ. මෙම පරිසර පද්ධතිය තුළ ශ්‍රී ලංකාවේ දැනට වාර්තාගත පෘෂ්ඨවංශිකයන් අතරින් සියයට 40 ක් පමණ ප්‍රතිශතයක් ඇතුළත් වන බව සැලකේ. මෙම විශේෂයන්ගෙන් බොහොමයක් ශ්‍රී ලංකාවට ආවේණික ඒවා වන්නාසේම ඉතා විරල මෙන්ම දැනට වඳවී යාමේ තර්ජනයකට මුහුණදී ඇති විශේෂ ලෙසද සැලකේ.

ජෛව විවිධත්වය අතින් ඉතා වැදගත් මෙම පරිසර පද්ධතිය තුළ හමුවන ක්ෂීරපායීන් අතරට වවුලා, උණහපුළුවා,මීමින්නා, රිළවා,දියබල්ලා, කොළදිවියා ද ඇතුළත් වන අතර විවිධ වර්ගයේ පක්ෂීන් නිරීක්ෂණය කිරීම සඳහා ද හොඳ කෙම්බිමක් වි ඇත. දැනට මෙහිදී පක්ෂි විශේෂ 125 ක් පමණ නිරීක්ෂණය කළ හැකි බව පැවසෙන අතර ඉන් පක්ෂි විශේෂ 40 ක් ම විදේශ සංක්‍රමණික පක්ෂීන් ලෙසද සැලකේ. ඒ අතර කොරවක්කා, තිල්කිතුලා, කරවැල් කොකා,ලොකු සුදු කොකා, කළපු පිළිහුඩුවා, දියකාවා, බමුණු උකුස්සා බහුලව නිරීක්ෂණය කළ හැකිය. මීට අමතරව, ඉඳ හිට ඇස ගැහෙන කිඹුලන් ද , විශාල වශයෙන් දැකිය හැකි කබරගොයන් ද පළා කටුස්සා වැනි කටුසු විශේෂ ද නයා, පොළඟා,දියබරියා දක්වා වූ උරග විශේෂ ද මුතුරාජවෙල









පරිසර පද්ධතියේ උරුමක්කාරයෝ වෙති. වෘක්ෂ ලතාදිය පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී කළපුව හා ගං ඉවුර ආශ්‍රිතව වැඩී ඇති කඩොලාන ශාක පද්ධතිය ද ඉතා වැදගත් තැනක් ගනී. එපමණක් නොව ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු කර්මාන්තය සඳහා යොදගනු ලබන ගොංකදුරු මෙන්ම කිරල, වෙල්ආතා, හම්බුපත්, කැරන්කොකු, වැටකෙයියා, ඕලු හා කංකුං වැනි පලා වර්ග ද මෙහි සුලභව දැකිය හැකිවේ.



මුතුරාජවෙල පරිසර කේන්ද්‍රය, මෙහි පිහිටුවා ඇති වැදගත් සංචාරක මධ්‍යස්ථානයකි. මෙම මධ්‍යස්ථානය මගින් මුතුරාජවෙල පරිසර පද්ධතිය පිළිබඳව හැදෑරීම සඳහා පාසල් හා විශ්ව විද්‍යාල සිසු සිසුවියනට මෙන්ම පරිසරවේදීන්ට ද මහඟු සේවයක් ඉටු කරනු ලැබේ.

මේ අතර, පරිසර මාර්ගෝපදේශකයකුගේ NATURE GUIDE මඟ පෙන්වීම යටතේ සංවිධානය කරනු ලබන බෝට්ටු චාරිකාව සංචාරකයන්ට නව මාදිලියේ අත් දැකීමක් ලබාදෙනු නිසැකය.



සංචාරක මධ්‍යස්ථානය අසලින්, දහසය වන සියවසේදී ලංදේසීන් විසින් තනන ලද හැමිල්ටන් ඇල ඔස්සේ ආරම්භ කෙරෙන මෙම බෝට්ටු චාරිකාව, හැමිල්ටන් ඇලෙන් දඬුගම ඔයටත් එතැනින් මිගමුව කළපුවටත් සංචාරකයන් රැගෙන යන්නේ කඩොලාන පද්ධතියත් එහි වෙසෙන සත්ව හා ශාක ප්‍රජාවත් පිළිබඳව මාර්ගෝපදේශක විසින් කරනු ලබන විස්තර කර දීම් (iNTERPRETATIONS) ද සහිතවය. මුතුරාජවෙල පරිසර කේන්ද්‍රයේ සිට මීගමුව කළපුව තෙක් බෝට්ටුවෙන් ගොස් ආපසු ඒමට එම පරිසර චාරිකාවට ගතවන්නේ පැය එක හමාරත් දෙකත් අතර කාල පරාසයකි. සෞන්දර්යය රස විඳ දරා ගනිමින් බෝට්ටු චාරිකාවක යෙදෙන සංචාරකයෙකුට විවිධ වර්ගයේ පක්ෂි විශේෂ, සමනල විශේෂ , බත්කූරන්, උරගයන් පමණක් නොව කැරැංගාල්, ගිංපොල්, හා කිරල යායවල් ද නෙතට සිතට ලබා දෙන්නේ අමුතුම චමත්කාරයකි. ❑